# තිරසාර ගම්මාන වැඩසටහන

## හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

## උඩවෙල ග්‍රාම නිලධාරී වසම

## සමීක්ෂණ වාර්තාව

( සහභාගීත්ව ගැමි විමසුම් ක්‍රමවේදය ඇසුරිනි )

2009/06 2010/04

2001

# පෙරවදන

රජයේ තිරසාර ගම්මාන සංවර්ධන වැඩ සටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්, හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ , උඩවෙල ග්‍රාම නිලධාරි වසම තෝරාගෙන ඇත. කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍ය ගරු එස්. බි. දිසානායක මැතිතුමාගේ උපදේශකත්වය මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනය හා හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මෙහෙයවීම මත ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන යටතේ උඩවෙල ගම්මානයේ එළවළු හා අර්තාපල් ගොවීන්ගේ ගැටළු සමූහයකට විසඳුම් ලබා දීමට අපේක්ෂිතයි. නව තාක්ෂණය හඳුන්වා දීම, නව වෙළඳපල හඳුන්වා දීම , නව බීජ හඳුන්වා දීම , එළවළු හා අර්තාපල් වගාව සඳහා විවිධ උපදේශන සේවා සැපයීම හා ගොවීන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම යනාදි සේවාවන් ඒ අතර ප්‍රධාන වෙයි.

ප්‍රාදේශිය තාක්ෂණික කමිටුව හා උඩවෙල ගම්වාසීන් සමඟ උඩවෙල ගම්මානයේ සහභාගිත්ව ගැමි විමසුම් ක්‍රමවේදය පදනම් කරගෙන කරන ලද සමීක්ෂණයකට අනුව හඳුනාගන්නා ලද ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබාදීම තුලින් එම ගම තුල සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති කරලීම " තිරසාර ගම්මාන වැඩසටහන " යටතේ බලාපොරොත්තු වේ.

MFN 5862

21457

21457

පුස්තකාලය
LIBRARY
හෙ.ක.ගො.ප.පු.ආ
HARTI

# පදනම් තොරතුරු සමීක්ෂණය සඳහා දායකවූවෝ

I. උඩවෙල ගම්වාසීන් :-

D.M. රම්බන්ඩා මයා
H.M. හිම්බන්ඩා මයා
S.G. ගුණදාස මයා
R.G. නවරත්න මයා
G.M. කළුබන්ඩා මයා
I.M. විජේසිංහ බන්ඩා මයා
T.M. මුතුබන්ඩා මයා
R.M. ධර්ම ශ්‍රී රාජපක්ෂ මයා
සේපාල රාජපක්ෂ මයා
K.M.C.P. ගුනරත්න මයා
A.G. ගුනතිලක මයා
D.M. වීරකෝන් බන්ඩා මයා
B.G. ධනපාල මයා
M.M. ජයතිලක මයා
P.M. යසවතී මිය
M.R.M. පුංචි බන්ඩා මයා
M.G. හින් මැණිකා මිය
H.D.C. මැණිකේ මිය
P.L.B. උඩුවැල්ල මිය
J.P. බන්ඩාර මිය
S. බිසෝ බන්ඩාර මිය
P.M. සෝමාවතී මිය
R.G. රන්බන්ඩා මයා

II.ප්‍රාදේශිය තාක්ෂණික කමිටු නිලධාරින්

III.හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිපර්යේෂණ ආයතනයේ සහාය පර්යේෂණ නිලධාරින්

IV. පූර්ණ අධීක්ෂණය හා මෙහෙයවීම :

ගාමිණී රාජකරුණා මයා
ප්‍රාදේශීය ලේකම් , හඟුරන්කෙත

V. සම්බන්ධීකරණය :

බන්ඩාර රත්නායක
අධි පර්යේෂක ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනය

VI. වාර්තාව පිළියෙල කිරීම :-

පී.වී. බන්ඩාර මයා
සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හඟුරන්කෙත.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. ඓතිහාසික තොරතුරු විග්‍රහය | 1 |
| 2. දේශගුණික හා භූ විෂමතා ලක්ෂණ | 2 - 3 |
| 3. සමාජ අර්ථික තොරතුරු | 4 - 7 |
| I. පවුල් සාමාජික | |
| II. අධ්‍යාපනය | |
| III. ආදායම් උත්පාදක මාර්ග | |
| IV. නිවාස වල ස්වභාවය | |
| V. විදුලිය | |
| VI. පානීය ජලය | |
| 4. කෘෂිකාර්මික තොරතුරු | 8 - 9 |
| I. වර්තමාන භෝග රටාව | |
| II. කෘෂිකාර්මික යෝජනා | |
| 5. සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය | 10 - 11 |
| I. මහජන සෞඛ්‍ය තත්වය | |
| 6. හරස්කඩ අධ්‍යයන සටහන් | 12 |
| 7. ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම | 13 - 23 |
| 8. ඇමුණුම් | |
| I. උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ සමාජ සිතියම | |
| II. හරස්කඩ අධ්‍යයන සටහන | |
| III. ඒකාබද්ධ සංවර්ධන සැලැසුම් සිතියම | |
| IV. දේශගුණික ලක්ෂණ සටහන | |



පුස්තකාලය
LIBRARY
HARTI

# ඓතිහාසික තොරතුරු

සීතාවක රාජසිංහ රජු සමයේ රජු ආරක්ෂක ප්‍රදේශයක් ලෙස පැවති මන්දාරම්නුවර ප්‍රදේශය ඓතිහාසික වශයෙන් වැදගත් වූ ප්‍රදේශයකි. එම රජු සැඟවී සිටි මාලිගයේ නටබුන් වර්තමානයේද දක්නට තිබේ.

සෑම මොහොතකම මන්දාරම්නුවර වැසි තිබූ හෙයින් මෙම ප්‍රදේශය මන්දාරම්නුවර ලෙස ප්‍රසිද්ධ වී ඇත. රාවනා රජුගේ මන්දාරා නැමති බිසව මේ ප්‍රදේශයේ වාසභූමි කරගෙන සිට ඇති අතර ඒ නිසා මේ ප්‍රදේශය මන්දාරා පුරය ලෙස භාවිතා කර ඇති බවත් පසුව මෙම ප්‍රදේශය මල්සරානුවර ලෙස ප්‍රසිද්ධ වූ බවත් ජනවහරේ පවතින තවත් මතයකි.

වැල්ලගරිය සිට ශ්‍රී පාදය දක්වා වන්දනාවේ ගිය නඩයක් හදිසියේ ගිනි දැල්වූ පහනක් දැක එය නිරීක්ෂණය කිරීමට යොමු වී ඇත. එම ප්‍රදේශයේ වගා කොට වාසභූමි කරගැනීමට සුදුසු බිම් කොටසක් බව තේරුම් ගෙන වන්දනා ගමන අතහැර එහි පදිංචිවීමට කටයුතු කර ඇත. පවුල් 07 කින් ආරම්භ වී උඩවෙල මාලිගාතැන්න ප්‍රදේශ වාසභූමි බවට පත්විය.

මල්සරා නැමති ප්‍රාදේශීය නායකත්වයක් දැරූ කුමාරයෙක් යුද්ධයෙන් ආරක්ෂා වීම සඳහා මාලිගාතැන්න ප්‍රදේශයේ පදිංචියට පැමිණ ඇත. මෙම මාලිගාතැන්න ප්‍රදේශය ඒ යුගයේදී මල්සරානුවර යයි භාවිතා කර ඇත.

බෙලිහුල් ඔයට යාබදව ඇති මුතුකෙළිය අරාව ගල මෙම මල්සරා මුතු කෙළිය ගල යැයි ජනවහරේ පවතී. සංචාරවලදී මෙම කුමාරයා සෙල්ලිපි ඇඳි ගල අදත් දර්ශනය වේ. එම ගල " පිළි අදිනා ගල " යනුවෙන් අද ජනවහරේ පවතී.

මන්දාරම්නුවර ප්‍රදේශය පැරනි පුරාවස්තු පිළිබඳව ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් වන අතර ඒ ආශ්‍රිතව ඇති රංකොටියා බොක්ක , කොල්ලංගල , විල්කඩ වැනි ප්‍රදේශද පුරා වස්තුන් වලින් පරිපූරක ප්‍රදේශයකි. එබැවින් ඓතිහාසික මන්දාරම්නුවර පුරවරය එදා මෙන්ම අදත් හෙටත් ඓතිහාසික පුරවරයක් වශයෙන් පවතිනු නොඅනුමානය.

## උඩවල හා දෝතුරුගම ගම්මානයේ දේශගුණික හා භූ විෂමතා ලක්ෂණ

**පස :-**

මෙම ප්‍රදේශවල පස පහත පරිදි ගම්මානයේ කිහිප පොලක දැකිය හැකිය. ඒ අනුව

- ❖ මැටි පස ( ගමේ කඳු මුදුනෙහි ) දැකිය හැකිය )
- ❖ කලු ලෝම පස ( ගම්මානයේ පහල කොටසෙහි)
- ❖ රතු දුඹුරු මැටි පස ( ගම්මානයේ මැද කොටසෙහි)

මෙම ගම්මානයේ දැඩිව පස සෝදායාම දක්නට ලැබේ.

**නායයෑම්:-**

හොරගොල්ල වත්ත ආසන්නයේ පැරනි නාය යෑම් අවස්ථා දක්නට ඇත. එසේම වර්තමානයේ ඇතැම් ස්ථාන ඉරිතැලීමට ලක්වී ඇත.

**බෑවුම:-**

මෙම ගම්මානයේ මුලු ඉඩම් ප්‍රමාණය අදික බෑවුම් සහිත ඉඩම් වන අතර 60% ට වඩා බෑවුම් සහිත ඉඩම් වැඩි ප්‍රමාණයක් දක්නට ඇත. බෑවුම් අධික නිසා මේ දක්වා පාංශු සංරක්ෂණ ක්‍රම නිසි පරිදි අනුගමනය කර නොමැත.

ස්වාභාවික ජල මාර්ග හරස් කර එළවළු වගාව සඳහා ජලය ලබා ගැනීම හේතු කොට ගෙන පාංශු ඛාදනය දැඩිව සිදුව ඇති බව පෙනේ.

එළවළු වගාවද සම්පූර්ණ වශයෙන් කරනු ලබන්නේ අධික බෑවුම් සහිත ඉඩම් වල විමද පාංශු ඛාදනය වැඩි වීමට හේතු වී ඇත.

**වර්ෂාපතනය:-**

මෙම කොට්ඨාශයට වර්ෂාව ලැබෙන්නේ ප්‍රධාන වශයෙන් ඊසාන දිග මෝසම් සුලං මගින් වේ. එම අවුරුද්දේ ඔක්තෝබරයේ අග සිට ජනවාරි අග දක්වා වර්ෂාව පවතී.

නිරිත දිග මෝසම් සුලං මගින් මැයි , ජුනි, ජූලි වල වර්ෂාව ලැබේ.

මාර්තු, අප්‍රේල් , මැයි අන්තර් මෝසම් සුලං මගින් වැස්ස ලැබේ.

( ඇමුනුම අංක 01 )

සුළං :-

මෙම ප්‍රදේශයට මැයි සිට සැප්තැම්බර් දක්වා තද සුළං ලැබෙන අතර පෙරට වඩා අඩුව දෙසැම්බර් දක්වා පවතී. ( ඇමුනුම අංක 01 )

උෂ්ණත්වය:-

මෙම ගම්මානයේ පෙබරවාරි සහ මාර්තු මැද දක්වාද අගෝස්තු මාසයේද දැඩි උෂ්නත්වයක් ඇත. සාමාන්‍යයෙන් $25^{0}$ ට වඩා වැඩිව ඇත.

ජල කදුරු :-

මෙම ගම්මානයේ දෝතුරු කදුර සහ බෙලිහුල්ඔය ප්‍රධාන ජල මූලාශ්‍ර වේ. එයට අමතරව බෝගහ බොක්ක සහ සුදු කොටුව අතුරු ජල කදුරු වශයෙන් ඇත. මේවායේ ජල ප්‍රමානය පෙරට වඩා අඩු වී ඇති බව ගම්මුන්ගේ මතයයි. එයට හේතුව රක්ෂිත ප්‍රදේශ හෙළි කිරීම බව ගම්මුන්ගේ මතයයි.

# සමාජ ආර්ථික තොරතුරු

## පවුල් වල සාමාජික සංඛ්‍යාව

මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික ජීවන රටාවකට හුරුවී ඇති හෙයින් වැඩි පිරිසක් ජීවත් වන ප්‍රදේශයකි. ආර්ථිකය එළවළු වගාව . වී ගොවිතැන සහ මිශ්‍ර වගාව කරගෙන යනු ලැබේ. පවුල් වල ස්වභාවය පහත පරිදි වේ.

| සංඛ්‍යාව | පවුල් ගනන | ප්‍රතිශතය |
|---|---|---|
| 2 හෝ ඊට අඩු | 12 | 8 |
| 3 සිට 4 දක්වා | 53 | 37 |
| 5 සිට 6 දක්වා | 69 | 48 |
| 7 සිට 8 දක්වා | 9 | 6 |
| 8 වැඩි | 7 | 1 |

ඒ අනුව මුළු පවුල් ගනන 145 ක් වන අතර වැඩි සාමාජික සංඛ්‍යාවක් 5 සිට 6 දක්වා වේ.

## අධ්‍යාපන රටාව

ජනගහන හා පාසල් අධ්‍යාපනය දෙස බැලීමේදී සිංහල මිශ්‍ර පාසල් සහ දෙමළ මිශ්‍ර පාසල් ඇත. මෙයින් සිංහල පාසලට හොරගොල්ල ගමේ ජීවත් වන බොහෝ පාසල් දරුවන් මැයි සිට සැප්තැම්බර් දක්වා තද සුළං කාලයේ පාසල් යාම බොහෝ දුරට අඩු වී ඇත. මෙම ප්‍රදේශයේ මුළු පිරිමි සංඛ්‍යාව 348 මුළු ගැහැණු 327 යි. මුළු ජනගහනය 675 ක් වේ. මෙයින් පාසල් යන පිරිමි ළමයි 89 ක්ද පාසල් යන ගැහැණු ළමයි 92 ක් වේ. පාසල් යන මුළු සංඛ්‍යාව 181 යි. දෙමළ පාසලේ පන්ති 5 වසර දක්වා පමනි.

## රැකීරක්ෂා ව්‍යුහය

| රැකියාව | පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ගොවිතැන | 263 | 82 |
| රාජ්‍ය හා පෞද්ගලික | 33 | 10 |
| කුලී වැඩ | 14 | 04 |

| | | |
|---|---|---|
| වෙළඳාම හා ස්වයං රැකියා | 12 | 04 |
| විදේශ රැකියා | 01 | 0 |
| එකතුව | 323 | 100 |

**ආදායම් උත්පාදන මාර්ග**

ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආදායම් උත්පාදක මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි. එයින් කෘෂිකර්මය ප්‍රධාන ජීවන මාර්ගය ලෙස පවුල් 136 ක් ද දෙවන ආදායම් මාර්ගය ලෙස පවුල් 5 ක් ද වේ. සත්ව පාලනය දෙවන ආදායම් මාර්ගය වේ. පවුල් 6 යි. මෙම පවුල් වලින් සමෘද්ධි දීමනාව දෙවන ආදායම් මාර්ගය ලෙස පවුල් 28 ක් ලබා ගනී. පෞද්ගලික අංශයේ රැකියාවල ප්‍රධාන ආදායම් ලෙස පවුල් 06 ක්ද දෙවන ආදායම් ලෙස පවුල් 13 ක්ද වේ.

පදිංචි නිවසේ එම ඉඩමේ හිමිකම පිළිබඳව ස්වභාවය පහත පරිදි වේ.

| නිවසේ අයිතිය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශත ය | ඉඩමේ අයිතිය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| තමාගේ නිවස | 124 | 85 | තමාගේ ඉඩම | 79 | 55 |
| කුලී නිවස | 1 | 1 | රජයේ ඉඩම | 44 | 30 |
| දෙමව්පියන්ගෙන් | 17 | 12 | දෙමව්පියන්ගෙන් | 18 | 12 |
| වෙනත් | 3 | 2 | වෙනත් | 1 | 3 |
| එකතුව | 145 | 100 | | 145 | 100 |

**නිවාස වල ස්වභාවය**

| <u>බිත්ති</u> | <u>නිවාස ගනන</u> | <u>ප්‍රතිශතය</u> |
|---|---|---|
| ගඩොල් | 20 | 14 |
| මැටි | 1 | 1 |
| වරිච්චි | 3 | 2 |
| සිමෙන්ති ගල් | 23 | 16 |
| කළු ගල් | 98 | 68 |

| <u>වහල</u> | <u>නිවාස ගනන</u> | <u>ප්‍රතිශතය</u> |
|---|---|---|
| උළු | 79 | 54 |
| පොල් අතු | 10 | 2 |
| ටකරන් | 22 | 15 |
| ඇස්බැස්ටස් | 34 | 23 |
| කොන්ක්‍රීට් | 7 | 05 |

| ගෙබිම | නිවාස ගනන | ප්‍රතිශතය |
|---|---|---|
| සිමෙන්ති | 67 | 46 |
| ගොම මැටි | 78 | 54 |

මෙම ප්‍රදේශයේ නිවාස වැඩි ප්‍රමාණයක් වර්ග අඩි 500 අඩු නිවාස ගනන 84 වේ. 500 සිට 750 දක්වා 25 ක්ද 750 සිට 1000 දක්වා 24 ක්ද 1000 සිට 1250 දක්වා 11 ක් වේ. 1250 සිට 2000 අඩු නිවාස දක්නට ඇත්තේ 1 ක් පමනි.

විශේෂයෙන්ම මෙම නිවාස වල ස්වභාවය දෙස බැලීමේ දී කටු මැටි ගෙවල් දක්නට ලැබෙන අතර කළුගල් භාවිතය වැඩිවශයෙන් දක්නට ඇත. එය ලාභදායී වේ.

මෙම නිවාස සඳහා වල වැසිකිලි 25 ක්ද ජල මුද්‍රිත 109 ක්ද වැසිකිලි නැති ප්‍රමාණය 11 ක් ද වේ. එසේ උවද පවුලේ නිවාස දෙකකට 1 වැසිකිලියක් ඇති සංඛ්‍යාව මෙයට ඇතුලත් නොවේ. හොරගොල්ල කොටසේ වතු ආශ්‍රිත කම්කරුවන්ගේ නිවාස සඳහා වැසිකිලි පහසුකම් නොමැත. එම ප්‍රදේශයේ පිරිසිදු ලයින් කාමර වල පවුල් 53 කට ඇත්තේ එක පොදු වැසිකිලියක් පමනි. ගමේ ජලය ඇතත් සම්පූර්ණයෙන්ම වැසිකිලි නොමැති නිසා ජලය මුළුමනින්ම අපවිත්‍ර වී ඇත. ගමේ උඩ කොටසේ මෙම හොරගොල්ල කොටසට අවම වශයෙන් එක පවුලකට එක වැසිකිලියක් වත් ලබා දීම ඉතා අත්‍යාවශ්‍ය වේ.

විදුලිය හා ගෘහ උපකරණ භාවිතය

මෙම ගමේ නිවාස 75 කට විදුලිය පහසුකම් ඇත. නිවාස 68 ක් භූමි තෙල් වලින්ද නිවාස 02 ක් සූර්ය කෝෂ වලින්ද ආලෝකය සපයා ගනී. 112 ක් ගුවන් විදුලි යන්ත්‍ර භාවිතා කරන අතර නිවාස 75 කට රූපවාහිනී යන්ත්‍ර ඇත. නිවාස 60 කට මහන මැෂින් ඇති අතර ස්ප්‍රේ යන්ත්‍ර නිවාස 52 කට ඇත. නිවාස 2 කට ට්‍රක් ලොරි රථ 4 ක් සහ වාහන පහසුකම් ඇති නිවාස සංඛ්‍යාව 2 ක් වේ. ඒ අය ව්‍යාපාර කටයුතු වල නිරතව සිටී.

පානීය ජලය සපයා ගැනීම

උල්පත් ජලය අධාර කරගෙන නිවාස 76 ක් නල ජලය සපයාගෙන ඇත. කුඩා දිය පාරවල් වලින් නිවාස 24 කට බීමට ජලය ගනී. කඳුරු වලින් නිවාස 18 ක් ජලය ලබා ගන්නා අතර පොදු ළිං මගින් පවුල් 14 ක් ජලය සපයා ගනී. විශේෂයෙන්ම හොරගොල්ල ආශ්‍රිතව ජල මූලාශ්‍ර රාශියක් ඇති අතර ඒවා අසල පදිංචිව ඇත්තේ හොරගොල්ල වත්තේ කම්කරුවන්ය. ඔවුන්ට ස්ථිර වැසිකිලි පහසුකම් නොමැත. මෙම ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම බහුලව සිදුවේ. දෝතුරු කඳුර ආශ්‍රිතව ජීවත්වන පවුල් වලට මෙම අපවිත්‍ර ජලය ලබා ගැනීමට සිදුවී ඇත.



පුස්තකාලය
LIBRARY
හෙ.යො.ශා.,ප.පු.ආ
HARTI

මෙම ප්‍රදේශයේ අධික සීතල ස්වභාවයක් පවතින හෙයින් සනීපාරක්ෂාව පිළිබදව දැනුවත් කමක් නොමැති බව පෙනේ. මෙම රෝග සහ පාචනය. ජලය ආශ්‍රිතව ඇති බෝවන රෝග බව පෙනේ. පෝෂ්‍ය ආහාර වේලක අවශ්‍යතාවය පිළිබදව දැනුවත් කමක් නොමැති බව පෙනේ. මාර්ග දුෂ්කර තාවය බෙහෙවින් බලපාන හෙයින් ආර්ථික තත්වය දියුණු කිරීමට දුෂ්කර වී ඇත.

# කෘෂිකාර්මික තොරතුරු

## කෘෂිකාර්මික තොරතුරු හා දත්ත

### පස හා ඉඩම් පරිහරණය:-

අවධිමත් ඉඩම් පරිහරණ රටාවක් තුල කාලාන්තරයක් තිස්සේ අධික ලෙස සෝදා පාලුවට ලක්වූ ව්‍යාපෘති බල ප්‍රදේශයට අදාල ඉඩම් රතු හා පොඩ්සොලික් පසින් යුක්තය.

මෙම භූමි ප්‍රදේශය 20% සිට 100% දක්වා සහ ඊට ඉහල බෑවුම් වලින් සමන් විතය.

මෙම ප්‍රදේශයේ ඉඩම් වලින් 20% ක් පමන පාංශු සංරක්ෂනය තුල ඉඩම් සහ එතරම් සෝදාපාළුවට ලක් නොවූ කුඹුරු ඉඩම් වලින් සමන් විතය. ඉතිරි 80% ක් පමන වූ ගොඩ ඉඩම් ප්‍රමාණය අත්‍යාවශ්‍යයෙන්ම පාංශු සංරක්ෂණය කල යුතු භූමි ප්‍රමානයකින් සමන්විතය.

### දැනට ඇති භෝග රටාව:-

1. වැවිලි බෝග යටතේ තේ වගාව අක්කර 16 ක් ගොවි පවුල් 47 ක් කුඩා තේ වතු හිමියන් අතරේ බෙදී ඇත.
2. අක්කර 178 ක් මතුරට වැවිලි සමාගම යටතේ පාලනය වේ.

3. **එනසාල් හා කරදමුංගු වගාව**
   එනසාල් වගාව අක්කර 1/8 සිට අක්කර 02 දක්වා වූ වපසරියකින් යුක්තය. ගොවීන් 08 දෙනෙකු අතර අක්කර 10 ක් බෙදී ගොස් ඇත.

4. **පලතුරු වගාව**
   කෙසෙල් වගාව අක්කර 10 ක් ගොවීන් 20 ක් අතරේද අලිපේර වගාව අක්කර 12 ක් ගොවීන් 60 ක් අතරේද පැණි දොඩම් අක්කර 02 ක් ගොවීන් 28 දෙනෙකු අතරේද පළතුරු වගාවට යොමු වී ඇත. මෙම වගාවන් ගෙවතු මට්ටමේ වගාවන් ලෙස දැක්විය හැකිය.

5. එළවළු

මෙම ප්‍රදේශය තුළ උඩරට එළවළු බහුල වශයෙන් වගා කෙරේ. විශේෂයෙන් අතිරේක ආහාර බෝග ලෙසට ගැනෙන අර්තාපල් අක්කර 60 ක් පමන හා රතුළූනු අක්කර 12 ක් යල කන්නයේ හා මහකන්නයේදී කදුකර ප්‍රදේශයේද යලකන්නයේ කුඹුරු වලද වගා කරනු ලැබේ. මෙයට අමතරව බීජ බෝංචි නිෂ්පාදනය වැඩසටහන අක්කර 04 ක් පමන භූමි ප්‍රමාණයක් වෙන් වී ඇත. එළවළු බෝග වගාවන් තක්කාලි. ගෝවා. කැරට්. ලීක්ස්. බෝංචි ආදී එළවළු සුළු වශයෙන් වගා කරනු ලැබේ.

6. වී වගාව

වී වගාව අක්කර 130 ක් අස්වැද්දා ඇති වුවත් මාස්කන්නයේ වී වගාවට යොමු වී ඇත්තේ අක්කර 97 කි. යලකන්නයේ අක්කර 22 ක් හා පැරණි වැඩි දියුණු කළ වී හා දේශීය " හීනටි " වී වගාවට යොදා ගනී.

# සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය

## වැසිකිළි හා වැසිකිළි නොමැති පවුල්

මෙම ගම්මානයේ පවුල් 253 පමණ ජීවත් වේ. මේ අනුව හොරගොල්ල ගම්මානයේ පවුල් 53 ක්ද නව ජනපදයෙහි පවුල් 45 ද උඩවෙල ගමෙහි පවුල් 20 ක්ද වැසිකිළි පහසුකම් නොමැති බව දක්නට ලැබේ. මේ අය වැසිකිළි වෙනුවට වෙනත් විකල්ප ක්‍රම යොදා ගෙන ඇත. මේ හේතුව නිසා පාචනය බෝවන සෙංගමාලය වැනි රෝග බහුලව දක්නට ලැබේ.

## පානීය ජලය

මෙම ග්‍රාම නිලධාරී වසම තුල පානීය ජලය තිබුනත් විධිමත්ව ජලය පානය නොකිරීම නිසා වමනය, පාචනය බෝවන සෙංගමාලය යනාදී රෝග මෙම ගම්මානය තුල බහුලව දක්නට ලැබේ.

## මුළුතැන්ගෙය

සෑම නිවසකම පාහේ ක්‍රමවත් මුළුතැන්ගෙයක් නොමැතිකම නිසා ගම්මුන් මහත් අසීරුතාවයන්ට පත්ව ඇත. මේ අනුව දුම් කවුළු සකස්කර නොමැතිකම. එහි භාන්ඩ පිළිවෙලට නොතැබීම . කෘමි සතුන්ගේ ආහාරවලට හානි ඇතිකිරීම බහුලව දක්නට ලැබෙන හේතූන් වේ.

## ගෙවතු වගාව

ගෙවතු වගා කිරීම සඳහා නිවස තුල ඉඩ ප්‍රමානය තිබුනත් එසේ වගා නොකොට වෙළඳ පළ තුලින්ම එළවළු සපයා ගනී. මේ නිසා අමතර මුදලක් වැය කිරීමට සිදුවේ. තවද මෙම ප්‍රදේශය තුල අලිපේර . පැපොල්. දොඩම්. පීස් පෙයාස් යනාදිය ප්‍රධානවේ.

## කැළි කසල බැහැර කිරීම :-

මෙම ප්‍රදේශයේ කැළිකසල බැහැර කිරීමේ විධිමත් ක්‍රම භාවිතා නොකරයි. කොම්පෝස්ට් වලවල් නිවාස කීපයක හැර අනෙකුත් නිවාස වල දැකිය නොහැකිය. මවුන් අපද්‍රව්‍ය නිවාස අසලම බැහැර කිරීම නිසා නිවාස අවට අපවිත්‍රතාවයට පත්ව ඇත.

# හරස්කඩ අධ්‍යයනය

උඩවෙල ග්‍රාමයේ පවතින සම්පත් හඳුනා ගැනීම හා ගැටළු හඳුනාගැනීම සඳහා සහභාගීත්ව ගැමි විමසුම් ක්‍රමවේදය ඉතා ඵලදායී සමීක්ෂණ විධික්‍රමයක් විය. ප්‍රාදේශීය තාක්ෂණික කමිටුව කණ්ඩායම් හතරකට කොටස් වශයෙන් කැඩී ගම්වාසීන් ද කැටුව ගම සිසාරා මාර්ග හතරක් ඔස්සේ සමීක්ෂණයේ නිරත විය. හරස්කඩ ගමන් කිරීමේ දී පස . භූ විෂමතාවය . සෝදාපාලුව. ජනාවාස . ස්වාභාවික සම්පත් . බෝග වගාව සහ සමාජ. ආර්ථික ගැටළු. පිළිබඳව පුළුල්ව කරුණු අධ්‍යනය කරන ලදී. මහජනතාව සමග ගමන් කිරීම නිසා ඔවුන් සමග සාකච්ඡා කර නිවැරදි විනිශ්චයන්ට පැමිනීමට හැකිවිය. කන්ඩායම් හතරින්ම ගොනුකරගන්නා ලද තොරතුරු හරස්කඩ සටහන්වල වෙන වෙනම විශ්ලේෂණය කොට දක්වා ඇත.

ප්‍රදේශවාසීන් සමග සාකච්ඡා කරමින් ඔවුන්ගේ කැමැත්ත අනුව ප්‍රාදේශීය තාක්ෂනික කමිටුව විසින් ප්‍රදේශයේ පොදු ගැටළු සඳහා විසඳුම් ක්‍රියාමාර්ග ප්‍රමුඛතා ගතකිරීම් කළහ. පිළියෙල කරගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන සැලැස්ම යටතේ ඉදිරි වැඩසටහන් සම්පාදනය කිරීම සඳහා පොදු එකගතාවයකට පැමිනීමට හැකිවිය.

# තිරසාර ගම්මාන වැඩසටහන - උඩවෙල ග්‍රාම නිලධාරී වසම

## ක්‍රියාත්මක වැඩසටහන

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුව | | | ක්‍රියාත්මක කරන කාලය | | | | | | වගකීම් දරන රජයේ ආයතනය | වගකීම් දරන ප්‍රජා සංවිධානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රජයේ දායකත්වය | ප්‍රජා දායකත්වය | මුළු මුදල | ජූලි | අගෝස්තු | සැප්තැම්බ | ඔක්තෝම්බ | නොවැම්බ | දෙසැම්බ | | |
| පානීය ජල ව්‍යාපෘති | | | | | | | | | | | |
| 1. මීරිය කැලේ සිට උඩවෙල ගම කෙලවර දක්වා පානීය ජල මාර්ගය ඉදිකිරීම | 200,000 | 90,000 | 290,000 | √ | √ | | | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හගුරන්කෙත | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 2. මෙත්ඩිස් බංගලාවේ සිට උඩවෙල පංසල දක්වා පානීය ජල මාර්ගය ඉදිකිරීම | 15,0000 | 65,000 | 215,000 | √ | √ | | | | | එම | එම |
| 3. වෙරලු ගහ මුල රක්ෂිතයේ සිට හොරගොල්ල වතු නිවාස දක්වා පානීය ජල මාර්ගය ඉදි කිරීම | 15,0000 | 75,000 | 225,000 | √ | √ | | | | | එම | එම |
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති | | | | | | | | | | | |
| 1. උඩවෙල වෙල මැද කෘෂිපාර හා පාලම සංවර්ධනය | 250,000 | 110,000 | 360,000 | √ | √ | √ | √ | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හගුරන්කෙත | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 2. පංසල ලග සිට නො 07 දක්වා පාර සංවර්ධනය කිරීම | 300,000 | 130,000 | 430,000 | √ | √ | | | | | එම | එම |
| 3. දූම්කොල වත්ත සිට හොරගොල්ල දක්වා පාර සංවර්ධනය කිරීම | 150,000 | 65,000 | 215,000 | √ | √ | | | | | එම | එම |
| 4. එක්කුලු වාව පාර සංවර්ධනය කිරීම | 150,000 | 75,000 | 225,000 | √ | √ | | | | | එම | එම |
| 5. වරල්කැටිය පාර සහ පාලම සංවර්ධනය කිරීම | 250,000 | 120,000 | 370,000 | √ | √ | √ | √ | | | එම | එම |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **අතිරේක සුභ සාධන වැඩසටහන්** | | | | | | | | | | | |
| 1.පෙර පාසල් සංවර්ධනය | 75,000 | 35 000 | 110000 | √ | √ | | | | | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 2. සුවදැල් පොත සිට දෝතුරු කඳුර පාලම දක්වා විදුලි දිගුව | 100,000 | 45 000 | 145000 | | √ | √ | | | | විදුලි බල මංඩලය / ප්‍රා.ලේ.කාර්යාලය | |
| 3.සුසාන භූමියක් වෙන් කිරීම | | | | | √ | √ | | | | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | එක්සත් මරණාධාර සමිතිය<br>උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 4. උඩවෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම | 250000 | 110000 | 360000 | | √ | √ | √ | | | එම | |
| 5. උඩවෙල ගම සඳහා තැපැල් කරුවන් දෙදෙනෙකු ලබා දීම | – | – | – | | | | √ | √ | | වලමුල්ල උප තැපැල් කාර්යාලය | |
| 6. ඉඩම් සඳහා බලපත්‍ර / ඔප්පු ලබා දීම | – | – | – | | √ | √ | √ | √ | | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උඩවෙල ගොවි සමිතිය |
| 7. වන වගා ව්‍යාපෘති | 100000 | 50000 | 150000 | | | | | √ | √ | වන රක්ෂණ දෙපාර්තමේන්තුව | |
| **බෝග වගාව** | | | | | | | | | | | |
| 1. මිශ්‍ර පලතුරු වගාව | 50000 | 20000 | 70000 | | | | √ | √ | √ | මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථානය | උඩවෙල ගොවි සංවිධානය |
| 2. කිතුල් වගාව | 50000 | 20000 | 70000 | | | | √ | √ | √ | එම | එම |
| 3. එනසාල් වගාව | ” | ” | ” | | | | | √ | √ | එම | එම |
| 4. කෝපි වගාව | ” | ” | ” | | | | | √ | √ | එම | එම |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සුළු වාරිමාර්ග සංවර්ධනය** | | | | | | | | | | | |
| 1. දුම්කොල වත්ත ඇල සංවර්ධනය | 75000 | 35000 | 110000 | | | | | | | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උඩවෙල ගොවි සංවිධානය |
| 2. හොරගොල්ල ඇල ප්‍රතිසංස්කරනය | 100000 | 50000 | 150000 | | | | | | | එම | එම |
| 3. උඩවෙල දරාඩ ඇල ප්‍රතිසංස්කරනය | 100000 | 50000 | 150000 | | | | | | | එම | එම |
| **ස්වයං රැකියා ව්‍යාපෘතීන්** | | | | | | | | | | | |
| 1. කිරිගව පාලනය | 200000 | 85000 | 285000 | | √ | √ | √ | √ | √ | රිකිල්ලගස්කඩ පශු වෛද්‍ය කාර්යාලය | උඩවෙල ගොවි සංවිධානය |
| 2. එළු පාලනය | 120000 | 514000 | 1714000 | | √ | √ | √ | √ | √ | එම | එම |
| 3. ගම් කුකුළු පාලනය | 100000 | 50000 | 150000 | | √ | √ | √ | √ | √ | එම | එම |
| 4. මී මැසි පාලනය | 50000 | 20000 | 70000 | | √ | √ | √ | √ | √ | එම | එම |
| 5. බිම්මල් පාලනය | 50000 | 20000 | 70000 | | √ | √ | √ | √ | √ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | එම |
| 6. මල් වගාව | 25000 | 10000 | 35000 | | √ | √ | √ | √ | √ | එම | එම |
| 7. පැල තවාන් කිරීම | 75000 | 30000 | 105000 | | | √ | √ | √ | √ | එම | එම |
| නිවාස අලුත් වැඩියාව | 300000 | 130000 | 430000 | | √ | √ | √ | | | ජාතික නිවාස සං. අධිකාරිය / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| අධ්‍යාපන සංවර්ධනය | | | | | | | | | | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය හගුරන්කෙත | |
| 1. එලමුල්ල ප්‍රාථමික විද්‍යාලයේ 6 වසර සිට 11 වසර දක්වා පන්ති ආරම්භ කිරීම හා කටයුතු කිරීම | | | | | | | √ | √ | √ | | |
| 2. උඩවෙල විද්‍යාලයේ පරිසනක | 500 000 | 200 000 | 700 000 | | | √ | √ | √ | √ | එම | |

## යෝජිත ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන සැලැස්ම

පානීය ජල ව්‍යාපෘති :-

1. මිරිය කැලේ සිට උඩවෙල ගම කෙලවර දක්වා පානීය ජල මාර්ගය ඉදිකිරීම

උඩවෙල ගම්වාසීන් සඳහා බල පාන ප්‍රධාන ගැටළු අතර පානීය ජල ගැටළුව ප්‍රධාන වෙයි. මේ හේතුව නිසා ජනතාව විශාල දුෂ්කරතාවයකට පත්ව සිටින අතර මේ සඳහා ඉතා පහසුම විසඳුම් මාර්ගයක් ලෙස මෙම ව්‍යාපෘති යෝජනාව ඵලදායී ක්‍රියාමාර්ගයක් ලෙස සැලකිය හැකිය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් පවුල් 38 ක් පමණ සෙත සැලසෙන බව සමීක්ෂණයේදී අනාවරනය කිරීමට හැකිවිය.

2. මෙත්ඩිස් බංගලාවේ සිට උඩවෙල පංසල දක්වා පානීය ජල මාර්ගය ඉදි කිරීම

ඒ ආශ්‍රිත පවුල් 45 ක් පමණ පානීය ජල ගැටළුව ඇති බැවින් ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට කරුණු අනාවරනය විය. මෙත්ඩිස් බංගලාවේ පිහිටා ඇති කොටස් දිය උල්පත් කීපයක් ඇති අතර ඒ අනුව ස්වාභාවික රක්ෂිතයද ඇති බැවින් වර්ෂයේ සෑම කාලයකදීම දිය උල්පත් එකම ආකාරයකට ප්‍රමාණය අඩු වීමකින් තොරව තිබීමද හේතුවෙන් ව්‍යාපෘතිය මගින් ඵලදායී වාසි අත්කර ගැනීමට හැකියාව උදාවෙයි. ගම්මුන්ගේ ප්‍රධාන ගැටළු අතර ප්‍රධාන වන මෙම ගැටළුව සඳහා විසඳුමක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඉතා සුදුසු වේ.

3. වෙරළු ගහමුල රක්ෂිතයේ සිට හොරගොල්ල වතු නිවාස දක්වා පානීය ජල මාර්ගය ඉදි කිරීම

හොරගොල්ල ප්‍රදේශයේ පවුල් 28 ක් පමණ වර්ථමානයේ පානීය ජල ගැටළුව බෙහෙවින්ම පවතී. මේ නිසා බෝවන රෝග . වෙනත් අතුරු ආබාධ මෙම කොටසින් මීට පෙර වාර්ථා වී ඇත. එබැවින් මෙම ගැටළුව සඳහා විසඳුම් සෙවීමේදී වෙරළුගහ මුල රක්ෂිතය ආශ්‍රිතව දක්නට ලැබෙන විශාල දිය උල්පත් මගින් ජලය ගෙනවිත් මෙම ගම්වාසීන්ට ලබා දීමට හැකියාව ඇති බව පෙනේ. එබැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායී ක්‍රියාමාර්ගයක් වන්නේය.



21457

පුස්තකාලය
LIBRARY
ගො.ගො.ගො.ප.පු.ආ
HARTI

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මද්‍යස්ථානය ආරම්භ කිරීම | | | | | | | | | | | |
| 3. උඩවෙල ග්‍රාම නිලධාරි වසම සඳහා පුස්තකාලයක් ආරම්භ කිරීම | | | | | | √ | √ | √ | √ | ප්‍රාදේශීය සභාව හගුරන්කෙත | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |
| කුඩා තේ වතු සංවර්ධනය | | | | | | | | | | | |
| 1. තේ නැවත වගා කිරීම | 350000 | 150000 | 500000 | | | | √ | √ | √ | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | උඩවෙල ගොවි සංවිධානය |
| 2. තේ පාලු වගාව | 200000 | 85000 | 285000 | | | | √ | √ | √ | | |
| සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු | | | | | | | | | | | |
| 1. සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීම | 590000 | 230000 | 820000 | | √ | √ | √ | | | රිකිල්ලගස්කඩ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය . හගුරන්කෙත | උඩවෙල ග්‍රාම සංවර්ධන සමිතිය |

මෙම මාර්ගය ලක්වෙයි. මාර්ගය සඳහා දැරීමට සිදුවන පිරිවැය වසර 02 ක් තුළ නැවත ආර්ථිකයට ඵලදායී නිෂ්පාදනයට සැලකිය යුතු ප්‍රමාණයෙන් වැඩිවීම හේතුවෙන් එකතුවනු ඇත. මේ නිසා මෙම මාර්ගය කඩිනමින් සංවර්ධනය කර දීම ප්‍රතිලාභ තිව්‍ර කරන්නෙකි.

5. වරල්කැටිය පාර හා පාලම සංවර්ධනය කිරීම

වරල්කැටිය කොටසට ප්‍රවේශවන පාර හා පාලම දැඩි ලෙස සෝදා පාළුවට ලක්වී ඇත. මේ හේතුව නිසා මෙම මාර්ගය ඔස්සේ ගමන් කිරීමට දුෂ්කර බැවින් ගම්වාසීන් වෙනත් විකල්ප මාර්ග ඔස්සේ ගමන් කරයි. ඵලදායී ප්‍රවාහනය හා එදිනෙදා ගමනාගමනය සඳහා ප්‍රධාන වශයෙන් මෙම මාර්ගය සෝදාපාළුවට ලක්වීම නිසා බව ගම්වාසීන්ගේ විශ්වාසයයි. මේ නිසා මෙම මාර්ගය පිළිසකර දීම කාලෝචිත හා ඵලදායී ක්‍රියාමාර්ගයක් වේ.

අතිරේක සුභ සාධන වැඩසටහන්

1. පෙර පාසල් සංවර්ධනය

උඩවෙල පෙර පාසලේ විවිධ අඩුපාඩු ඇති බව සමීක්ෂණයේ දී අනාවරනය විය. ඒ අතර මෙස් බංකු, පොත්පත් , ළමා උයන ප්‍රධාන වෙයි. මේ නිසා කුඩා දරුවන්ගේ යහපත උදෙසා මෙම පෙර පාසලේ පවතින අඩුපාඩු අවම කිරීමට පියවර ගතයුතුව තිබේ.

2. සුවදැල් පොත සිට දෝතුරු කඳුර පාලම දක්වා විදුලි දිගුව

සුවදැල්පොත දක්වා පැමින නැවති ඇති විදුලි රැහැන් දෝතුරු කඳුර ගම් කොටස දක්වා දීර්ඝ කරදෙන ලෙස ගම්වාසීන් යෝජනා කර ඇත. දැනට මෙම ගම් කොටසට පමනක් විදුලිය නොමැති අතර අවට ගම්මාන වලට විදුලිය ලැබී ඇත. මෙම කොටසේ පවුල් 18 ක් පමන සිටින අතර විශාල පිරිවැයක් දැරීමට සිදුවීම නිසා ගම්මුන් විදුලිය ලබා ගැනීමට උත්සාහ නොකරයි. දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත් වන මෙම ගම්වාසීන් ප්‍රධාන ගැටළුවක්ව පවතින විදුලිය ලබා දීම තුලින් ගම්වාසීන්ගේ සමාජ සංවර්ධන ක්‍රියාවලියට අත දීමක් වන්නේය.

3. සුසාන භූමියක් වෙන් කිරීම :-

උඩවෙල ග්‍රාම නිලධාරි වසම සඳහා අඩුවක්ව පවතින සුසාන භූමියක් නොමැති කම නිසා ප්‍රදේශවාසීන්ට විශාල වශයෙන් පීඩාවට පත්වී ඇත. මේ නිසා රජයේ ඉඩම් කොටසක් මේ සඳහා

වෙන්කර දෙන ලෙස ගම්වාසීන්ගේ යෝජනාව වන්නේය. මේ ඉල්ලීම අනුව රජයේ සුදුසු ඉඩම් කොටසක් මේ සඳහා වෙන්කර දීම කාලෝචිත පියවරකි.

4. උඩවෙල ප්‍රජා ශාලාව ඉදි කිරීම

කාලයක් තිස්සේ උඩවෙල ග්‍රාම නිලධාරි වසමට අඩුවක්ව පවතින පොදු ගොඩනැගිල්ලක හිඟය නිසා මහජන රැස්වීම් පැවැත්වීමට දැඩි අපහසුවක් ඇති වී ඇත. ගමේ කෙලවරක පිහිටා ඇති පන්සලේ ධර්ම ශාලාව වර්තමානයේ පොදු රැස්වීම් පැවැත්වීමට යොදා ගනී. පොහොය දිනට හා පන්සලේ විශේෂ උත්සව කාලයක පොදු රැස්වීම් පැවැත්වීමට ස්ථානයක් නොමැත. තවද විහාරස්ථානය දක්වා විශාල දුරක්ද යාමට සිදුවීම නිසා ප්‍රජා සහභාගීත්වයද ඇතැම් අවස්ථාවල අඩු බව ගම්වාසීන් පවසයි. දැනට උඩවෙල කොටසේ ඇති කුඩා පිට්ටනිය අසල නව ප්‍රජාශාලාවක් ඉදිකිරීමට යෝජිත අතර එම ගොඩනැගිල්ල වහා ඉදිකර දීම ගම්වාසීන්ට විශාල සහනයක් වනු ඇත.

5. උඩවෙල ගම සඳහා තැපැල්කරුවන් දෙදෙනෙකු ලබා දීම:-

උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ ගම් කීපයක් ඇති අතර ඒ සෑම කොටසක්ම මන්දාරම් නුවර කලාපයට අයත් තැපැල් කරුවකු මගින් ලිපි බෙදාහැරීම සිදු කරනු ලබයි. මේ හේතුව නිසා දුර බැහැර කොටස්වලට ලිපි ලැබීම අවධිමත් වන අතර ප්‍රමාද දෝෂද පවතී. නො 07 අති දුෂ්කර ප්‍රදේශවල ලිපි වර්තමානයේ ලැබෙන්නේ අපිළිවෙලකටය. ඇතැම් ලිපි නොලැබී යන අවස්ථාද ඇති බව ගම්මුන් පවසයි. මේ නිසා විශාල වපසරියකින් යුක්ත උඩවෙල ගම්මානය සඳහා ලිපිබෙදාහැරීමට තැපැල් කරුවන් දෙදෙනෙකු අවම වශයෙන් ලබා දීම තුලින් ලිපි හුවමාරුව වඩාත් ක්‍රමවත්ව හා කාර්යක්ෂම වන්නේය.

6. ඉඩම් සඳහා බලපත්‍ර / ඔප්පු ලබා දීම

උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ ඇතැම් ගම් ප්‍රදේශවල ගම්මුන් රජයේ ඉඩම්වල පදිංචි සිටින අතර මායිම් ගැටළු, බලපත්‍ර නොලැබීම, හා ඔප්පු නොලබීමවැනි ගැටළු පවතින බැවින් ඉඩම් කච්චේරි පැවැත්වීම තුලින් කඩිනමින් එම අයගේ ඉඩම් ආරවුල් සඳහා විසඳුම් ලබාදීමට හැකියාව ලැබේ.

7. ජාතික හැඳුනුම් පත් / උප්පැන්න සහතික නොමැති අයට ලබා දීම

උඩවෙල ග්‍රාම නිලධාරි වසමේ හා දෝතුරු කඳුර ගම්මානයේ කීපදෙනකුටම ජාතික හැඳුනුම් පත් හා උප්පැන්න සහතික නොමැති බවට අනාවරනය විය. මේ හේතුව නිසා විවිධ අපහසුතා වලට එම අයට මුහුන දීමට සිදුවී ඇතැත් නොදැනුවත් කම නිසා අවශ්‍යතා සපුරා ගැනීමට අපහසුවී

ඇත. එබැවින් ඔවුන් සඳහා ජංගම සේවයක් පැවැත්වීම තුළින් අදාල ගැටළුවට විසඳුම් ලබා දීමට හැකිවේ.

8. වන වගා ව්‍යාපෘතීන්:-

- මීරිය කැලේ රක්ෂිතය
- වටගොම්මන කඳුර රක්ෂිතය
- බෝගහබොක්ක රක්ෂිතය
- වැරැල්ලහේන රක්ෂිතය
- මීරිය කැලේ සිට දෝතුරු කඳුර දක්වා රක්ෂිතය
- නො 15 ඉහළ කොටස රක්ෂිතය
- දෝතුරු කඳුර දෙපැත්ත රක්ෂිතය
- බෙලිහුල්ඔය රක්ෂිතය

උඩවෙල ග්‍රාමයේ ස්වාභාවික රක්ෂිත වන මීරිය කැලේ රක්ෂිතට ආශ්‍රිතව අනෙකුත් රක්ෂිත ප්‍රදේශ පිහිටා ඇති අතර ජනාවාස වීමත් සමග ක්‍රමයෙන් හීන වී යාම දක්නට පුළුවන. මේ නිසා මෙම රක්ෂිත ආරක්ෂා කිරීම හා නැවත වන පැලෑටි වගා කිරීමට කටයුතු කිරීම තුළින් දිය උල්පත් සියල්ල රැකගැනීමට හැකිවේ.

බෝග වගා ව්‍යාපෘති:-

1. මිශ්‍ර පළතුරු බෝග වගාව

මෙම ප්‍රදේශයේ බෝග වගාවට හොඳ දේශගුණයක් පවතින බැවින් ගම්වාසීන්ගේ අතිරේක ආදායම් වැඩිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය වඩා ඵලදායී වන්නේය. ජනතාවගේ කැමැත්ත මත මිශ්‍ර පළතුරු බෝග වගාව සඳහා ප්‍රතිලාභී පවුල් 25 ක් පමණ තෝරාගන්නා ලදී. මේ යටතේ අක්කර 25 ක් පමණ අලිගැටපේර . පේයාස් . අඹ. වැනි පළතුරු වර්ග වගා කිරීමට හැකියාව ඇත.

2. කිතුල් වගාව

අතීතයේ පටන් කිතුල් පැණි හකුරු හා කිතුල් රා සඳහා මෙම ප්‍රදේශය ප්‍රසිද්ධියක් උසුලයි. හිතකර දේශගුණයක් මෙන්ම හා තාක්ෂනික ඥානය ගම්මුන් තුල ඇති නිසා කිතුල් ආශ්‍රිත නිෂ්පාදිත සංවර්ධනය කිරීමට යෝග්‍ය පරිසරයක් තිබේ. සෑම පවුලකටම පැල 5 බැගින්

ප්‍රතිලාභී පවුල් 145 කට පැළ ලබා දීම තුළින් ගෙවතු වගාව හා අතිරේක ආදායම් මාර්ග සංවර්ධනය කිරීමට හැකිවේ.

### 3. එනසාල් වගාව

එනසාල් වගාව දැනටමත් දෝතුරු කඳුර ප්‍රදේශයේ හා අනෙකුත් ගම්වල දක්නට ලැබෙන බැවින් එනසාල් වගාව හොඳින් සංවර්ධනය කිරීමට හැකියාව ඇතැයි සමීක්ෂණයේදී අනාවරනය විය. මේ අනුව ප්‍රතිලාභී පවුල් 50 ක් පමණ එනසාල් වගාව සඳහා කැමැත්ත පළකරන ලදී.

### 4. කෝපි වගාව:-

කෝපි වගාව වගාවක් ලෙස දැනටමත් පවුල් 35 ක් පමණ වගා කර ඇති අතර එළදාවද වඩා යහපත් මට්ටමේ පවතින බැවින් වඩා හිතකර දේශගුණයක් ඇති බව අනාවරනය වේ. සමීක්ෂණයේදී ලබාගත් තොරතුරු අනුව කෝපි වගාව සඳහා පවුල් 150 ක් කැමැත්තෙන් සිටින බව තහවුරු විය.

## සුළු වාරි මාර්ග සංවර්ධනය

### 1. දූම්කොළ වත්ත ඇළ ප්‍රතිසංස්කරනය

දූම්කොළ වත්ත කොටසේ පවුල් 12 පමණ පදිංචි වී සිටින අතර අක්කර 12 පමණ වගා බිම් එම ප්‍රදේශයේ දක්කට ලැබේ. අතීතයේ යල මහ දෙකන්නයේම එම අක්කර 12 වගාකර ඇති අතර වර්තමානයේ එක් කන්නයක් පමනක් වගා කටයුතු සිදුකරයි. එයට හේතුව දූම්කොළ වත්ත ඇළ යල්පැන යාමත් මූළු මතින්ම කැඩී තිබීමක් නිසාය. එබැවින් මෙම ඇළ යළි ප්‍රතිසංස්කරණය කිරීම තුලින් දූම්කොළ වත්ත ගම්වාසීන්ගේ නිෂ්පාදන හැකියාව හා ආදායම් තත්වය ඉහළ නංවා ලීම අවස්ථාව උදාවනු ඇත.

### 2. හොරගොල්ල ඇළ ප්‍රතිසංස්කරණය:-

හොරගොල්ල පුදේශයේ ගොවිපවුල් 19 ක් පමන සිටින අතර අක්කර 16 ක් පමන දෙකන්නයේ වගා කරයි. එහෙත් ජලය නිසිපරිදි ලබා ගැනීමේ දුෂ්කරතා පැන නැගීමට හේතුව් තිබෙන එකම කාරනය වාරි ඇළ තැනින් තැන කැඩී තිබීමයි. මෙම ඇළ කොන්ක්‍රීට් ආස්තරනයක් යොදා වෙලි ප්‍රතිසංස්කරණය කර දීම තුලින් වගා බිම් සඳහා නිසි පරිදි ජලය ලබා දිය හැකිය. නිෂ්පාදිත ධාරිතාවය ඉහල නැන්වීමට අවස්තාව උදාවීම තුලින් ප්‍රදේශවාසීන්ගේ ආදායම ඉහල නන්වා ලීමට අවස්ථාව උදාවෙයි. ගමනාගමන පහසුකම්ද මෙම වාරිමාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම තුලින් ඇතිවේ.

## උඩවෙල දරාඩ ඇල ප්‍රතිසංස්කරණය

උඩවෙල ගම්මානයේ අක්කර 46 ක් පමන වගා කිරීම සදහා ජලය ලබා ගන්නා එකම වාරිමාර්ගය මෙයයි. මෙම වාරිමාර්ගයේ පැතිබැම් කීපයක් කැඩී ඇති නිසා එම ස්ථාන වලින් ජලය කාන්දුවීම නිසා වාරි මාර්ගය අවසානයේ වගා බිම් සදහා ජලය ලබා ගැනීමේ දී දුෂ්කරතා පවතී. එසේම වර්ෂා කාල වලදී ජල ධාරිතාවය වැඩිවීම නිසා අදික ලෙස ජල වේල්ල කැඩී ගිය ස්ථාන දැකිය හැකිය. එබැවින් එම ස්ථාන යලි කොන්ක්‍රීට් පැතිබැම් යොදා ප්‍රතිසංස්කරණය කිරීම තුලින් ප්‍රදේශවාසීන්ගේ වගා බිම් සදහා අඛන්ඩව ජලය ලබා දීමට හැකියාව ලැබේ.

## ස්වයං රැකියා ව්‍යාපෘතීන්

### 1. කිරිගව පාලනය

දැනටමත් පවුල් 10 ක් පමන කිරිගව පාලනය කරන අතර අවශ්‍ය තරම් ආහාර . ජලය තිබීමත්. හා ගෙවතු විහාල පරිමානයෙන් යුක් නිසාත් කිරිගව පාලනයට යෝග්‍ය පරිසරයක් ඇත. මේ නිසා ප්‍රදේශයේ සුළු වශයෙන් ඇති මන්දපෝෂන තත්වයට පිලියමක් වනවා පමනක් නොව අතිරේක ආදායම් උත්පාදන මාර්ගයක් වනු ඇත. සමීක්ෂනයේදී පවුල් 100 ක් පමන ගවපාලනයට කැමැත්ත පලකරන ලදී.

### 2. එළු පාලනය

ප්‍රදේශයේ පවුල් 100 ක් පමන එළු පාලනය දැනටමත් කරගෙන යන අතර එළු පාලනයට හිතකර පරිසරයක් තිබේ. අහාර. ජලය. ඉඩම් අවශ්‍ය තරම් ඇති බැවින් එළු පාලනය වැඩි කිරීම එලදායි ක්‍රියාමාර්ගයක් වන්නේය. පවුල් 25 ක් පමන අලුතින් එළු පාලනයට කමැත්ත පලකර ඇත.

### 3. ගම් කුකුළු පාලනය

අවට ප්‍රදේශ වලින් ගෙන්වා අලෙවි කරන ගම් බිත්තර ප්‍රදේශයේ අලෙවි සැල් වල දැකිය හැක. ප්‍රවාහන කුලී සමග බිත්තර වල අලෙවි මිල ගනන් ඉහල වටිනාකමක් ගනී. මේ නිසා ගමතුලම බිත්තර නිෂ්පාදනය කරගැනීමට හැකිවේ නම් ගම්වාසීන්ගේ ධනය පිට ප්‍රදේශවලට ඇදී යාම වලක්වා ගැනීමටත් . අඩු පිරිවැයකට බිත්තර මිලට ගැනීමට හැකියාවද උදාවෙයි. එසේම ගම් බිත්තර සදහා වෙළදපල ඉල්ලුම ඉතා ඉහල බැවින් එලදායී ප්‍රයෝජනයක් හා ලාභදායී ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස මෙය හැදින්වීමට පුළුවන. සමීක්ෂණයේදී ප්‍රජාව දැක්වූ අදහස් වලට අනුව ගම් කුකුළු පාලනය සදහා පවුල් 50 ක් පමන කැමැත්ත ප්‍රකාශකරන ලද අතර ගම් කුකුල් පැටවි ලබා දීම තුලින් ගම තුල මෙම ව්‍යාපෘතිය ආරම්භ කල හැකිය.

## 4. මී මැසි පාලනය

මී මැසි පාලනය පවුල් 5 ක් පමන වර්ථමානයේ ස්වයං රැකියාවක් ලෙස කරගෙන යයි. මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු පරිසරයක් ප්‍රදේශය පුරා පවතින බැවින් මී මැසි පාලනය ව්‍යාප්ත කිරීමට හැකියාව ඇති බව නිරීක්ෂනය තුලින් අනාවරනය විය. පවුල් 100 ක් පමන අලුතින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කැමැත්ත පලකර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම තුලින් ජනතාවගේ උත්සාහය ඵලදායී නිමාවක් බවට පරිවර්ථනය කල හැකිය.

## 5. බිම්මල් වගාව

ගෘහස්ථ වශයෙන් ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස මෙම කර්මාන්තය ආරම්භ කල හැක. බිම්මල් පාරිභෝජනය ප්‍රදේශයේ ඉතා ඉහල මට්ටමක පවතී. එහෙත් ඒ සඳහා ඉල්ලුම සපුරා ලීමට තරම් සැපයුමක් නොමැත. මේ නිසා මෙම ව්‍යාපෘතිය අලුතින් ආරම්භ කිරීම තුලින් විශාල ලාභයක් ලබාගැනීමට හැකියාව ඇත. අලුතින් පවුල් 25 ක් පමන මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කැමැත්ත පලකර ඇත.

## 6. මල් වගාව

ශීත දේශගුණයක් වසර මුළුල්ලේම පැවතීමත් අවශ්‍ය තරම් ජලය ලබාගැනීමට හැකියාව තිබීමත් නිසා මල් වගාව සඳහා සුදුසු පරිසරයක් මෙම ප්‍රදේශයේ ඇත. ඕකිඩ් ඇන්තූරියම් ඇට්ට්‍රස් ඩේලියා වැනි මල් වර්ග ඉතා පහසුවෙන් වගාකල හැක. මේ නිසා ප්‍රදේශවාසීන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාමාර්ගයක් ලෙස මල් වගාව හඳුන්වා දිය හැකිය. පවුල් 20 ක් පමන දැනටමත් කැමැත්ත පලකර ඇත. මෙම ව්‍යාපෘතිය විධිමත්ව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම රජයේ යුතුකම වන්නේය.

## 7. පැල තවාන් කිරීම

විවිධ පැල වර්ග තවාන් කිරීම සඳහා සුදුසු දේශගුණයක් හා ප්‍රමාණවත් තරම් ඉඩම් තිබීම නිසා සාර්ථක ව්‍යාපෘතියක් ලෙස පවත්වා ගෙන යාමට පුළුවන. දැනටමත් පවුල් 15 ක් පමන මේ සඳහා එකගතාවය පලකර ඇත.

# කුඩා තේ වතු සංවර්ධනය

## 1. තේ නැවත වගාව

තේ වගාව ඉතා පුළුල්ව කෙරෙන ප්‍රදේශයක් ලෙස උඩවෙල ගම්මානය හඳුන්වා දිය හැක. මේ නිසා ඉතාමත් සහපත් හා සාරවත් පසක් තිබීම නිසා තේ වගාව සඳහා ඉතා සුදුසුය. තේ නැවත වගාව සඳහා පවුල් 48 ක් අක්කර 18 ක් පමණ වගා කිරීමට කැමැත්ත පළකර ඇත. මෙම වගාව ව්‍යාප්ත කිරීම තුලින් ජාතික ආදායමට ප්‍රධාන වශයෙන් බලපාන ආදායම් මාර්ගයක් වන තේ ආදායම ඉහළ නන්වා ලීමට අවස්ථාව උදාවෙයි.

## 2. තේ පාලු වගාව

දැනටමත් තේ වගා කර ඇති කුඩා තේ වතු හිමියන්ගේ වගා බිම් වල පාලු වගාව සඳහා පවුල් 15 ක් පමණ කැමැත්ත පළකර ඇත. මෙලෙස පාලු වගාව තුලින් අක්කර 03 ක් පමණ ආවරනය වෙයි.

## සෞඛ්‍ය හා සනීපාරක්ෂාව

උඩවෙල හා දෝතුරු කඳුර ගම්මානවල සිදුකල සමීක්ෂණයේදී සනීපාරක්ෂක වැසිකිළි භාවිතය අවම වීම ප්‍රධාන සෞඛ්‍ය ගැටළුව විය. උඩවෙලට ඉස්මත්තතෙන් තේ වතු දැකිය හැකි වන අතර ඒ ආශ්‍රිතව ලයිත් 02 ක් පමණ පිහිටා ඇත. එම ලයින් සඳහා ද වැසිකිළි ප්‍රමානවත් පරිදි නොමැත. ඒ ආසන්නයෙන් පැන නැගෙන දිය දහරා පහළ බැවුමේ පදිංචි ගොවින්ගේ පානීය හා ගොවි බිම් වලට ලබා ගැනීමේ එකම මාර්ගයයි. එහෙත් මෙම ජලය අපිරිසුදු මට්ටමේ පැවතීමට හේතු වී අත්තේද මෙම වැසිකිළි පිළිබඳ ගැටළුවයි. මේ නිසා මෙම ගැටළුවට කඩිනමින් විසඳුම් ලබා දීම ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය ගැටළු අවම කිරීමට ප්‍රධාන උපකාරයක් වන්නේය.

## 1. සනීපාරක්ෂක වැසිකිළි අවශ්‍යතාවය

| | |
|---|---|
| හොරගොල්ල ගම | - පවුල් 53 |
| නව ජනපදය | - පවුල් 45 |
| උඩවෙල ගම | - පවුල් 20 |



පුස්තකාලය
LIBRARY
මොරටුව විශ්ව විද්‍යාලය
HARTI

2. නිවාස අලුත් වැඩියාව

අඩු ආදායම් ලාභී පවුල් 35% ක් පමන ප්‍රදේශයේ දක්නට ලැබේ. මේ නිසා තම නිවාස අලුත්වැඩියා කරගැනීමේ දැඩි අපහසුතාවයක් ඔවුනට පැනනැගී ඇත. එසේම ඇතැම් කාලවලදී මෙම ප්‍රදේශයට බලපාන අදික වැස්ස හා සුලඟ නිසා නිවාස බොහෝමයක්ට හානි සිදුවෙයි. අඩු ආදායම් ලාභින්ට මෙම ගැටළුවද ප්‍රබලව බලපායි. මෙලෙස හානි සිදුවී ඇති නිවාස කීපයක් අප හදුනා ගන්නා ලදී.

උඩවෙල ගම - පවුල් 25
හොරගොල්ල ගම - පවුල් 25
දෝතුරු කදුර ගම - පවුල් 10

මෙම ගම් සියල්ල උඩවෙල ග්‍රාම නිලධාරි වසමට අයත් වේ. මෙම පවුල් සදහා ඉතාමත් කඩිනමින් සහන සැලසීම අපගේ වගකීමයි.

## අධ්‍යාපන සංවර්ධනය

### 1. එළමුල්ල ප්‍රාථමික විද්‍යාලයේ 6 වසර සිට 11 වසර දක්වා පංති ආරම්භ කිරීම සදහා කටයුතු සම්පාදනය කිරීම

එළමුල්ල විද්‍යාලයේ දැනට 5 වසර දක්වා පංති පැවැත්වෙයි. එහෙත් පාසල ආසන්නයේ 6 -11 වසර දක්වා ඉගෙනුම ලබන සිසුන් බොහෝ සිටී. එම අය අධික මාර්ග අපහසුතා හා විවිධ දුෂ්කරතා මැද ඈත පිහිටි විද්‍යාල වලට ගමන් ගනී. මේ නිසා ළමුන්ගේ අධ්‍යාපනය නැඹුරුව අඩුවී 5 වසරකින් පසු ඉගෙනීමේ කටයුතු අත්හැර දමන තත්වයක් ඇත. මේ නිසා ක්‍රමයෙන් පාසල් වියේ පසුවන පාසල් නොයන දරුවන්ගේ ප්‍රමාණය වැඩිවීමත් දක්නය ලැබේ. මේ හේතුව නිසා ගම්වාසීන් මීට වසර කීපයකට පෙර සිට 6 වසර සිට 11 වසර දක්වා පංති පැවැත්විය යුතු බව යෝජනා කරයි. එහෙත් මේ දක්වා එම ඉල්ලීම ඉටු නොවීම නිසා අනාගතය අදුරට පත්කර ගත් දරුවන් බොහෝ දෙනෙක් මෙම ප්‍රදේශයේ දක්නට ලැබේ. එබැවින් මෙම ඉල්ලීම සදහා නැවත වරක් අවධානය යොමු කරන්නේ නම් වඩා යෝග්‍ය කරුනක් වන්නේය.

### 2. උඩවෙල විද්‍යාලයේ පරිඝණක මධ්‍යස්ථානය ආරම්භ කිරීම

මන්දාරම් නුවර ප්‍රදේශය අවට පාසල් කීපයක් දක්නය ලැබේ. විශාල ප්‍රමාණයෙන් සිසුන් අ.පො.ස ( පෙළ ) හා අ.පො.ස. (උ. පෙළ) විභාගයට සමත් වුවත් සදහා වෘර්තීය දැනුම


නොමැතිකම නිසා රැකියා අවස්ථා සොයා ගැනීමේ අපහසුතා වලට පැනනැගී ඇත. ප්‍රදේශයේ වෘර්තීය පුහුණු මධ්‍යස්ථාන කිසිවක් නොමැත. එබැවින් උඩවෙල විද්‍යාලයේ සිසුන්ට නව තාක්ෂණය පිලිබදව අවබෝධය ලබා දෙනු සදහා පරිඝනක මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරිම කාලෝචිත ක්‍රියාමාර්ගයක වන්නේය. ගම්වාසීන්ගේ හා තරුණයන්ගේද එක් ප්‍රධාන ඉල්ලීමක් ලෙස මෙය හැදින්විය හැක.

## 3. උඩවෙල ග්‍රාම නිලධාරි වසම සදහා පුස්තකාලයක් ආරම්භ කිරීම

මන්දාරම් නුවර .උඩවෙල. එළමුල්ල. ගුඩ්වුඩ් ප්‍රදේශවල දිළිදු ජනතාවගේ දූදරුවන්ගේ දැනුම පෝෂනය කරනු පිනිස පුස්තකාලයක අවශ්‍යතාවය ඉතා වැදගත්ය. සමාජීය දියුණුව උදෙසාත් . පාසල් යන දරුවන්ගේ යහපත උදෙසාත් පුස්තකාලයක් නොමැති කම නිසා විශාල අඩුපාඩුවක් පවතී. ප්‍රදේශයේ උගත් වැඩිහිටියන්ටද පුවත්පත් . පොත්පත් බැලීමට අවස්ථාව නොලැබීම මානසික අසහනයට තුඩු දෙන්නක් වේ. මේ නිසා සමස්ථ ප්‍රජාවගේ යහපත උදෙසා පුස්තකාලයක් ආරම්භ කිරීම ඥාණාන්විත ක්‍රියාවකි.


ඇමුනුම : 01

# උඩවෙල ග්‍රා:නි: වසම





1. ප්‍රධානමාර්ගය    2 වැලිපාර    3. අඩිපාර    4. නිවාස    5. දිය කඳුර

6. ඇල    7. ජලඋල්පත    8. ගල් කලාව    9. රක්ෂිතය    10. කුඹුරු.


උ
1
2
3
4

ඇමුණුම-03 ඩවෙල ග්‍රා: නි: වසමේ යෝජිත සංවර්ධන ව්‍යාපෘති.





පුස්තකාලය
LIBRARY
HARTI

1. සංවර්ධනය කළ යුතු වැලිපාරවල්

3. ජල යෝජනා ක්‍රම. (ජාතීය)

ඇමුණුම : 02

## හරස්කඩ අධ්‍යයනය 01



# හරස්කඩ අධ්‍යයනය 02

4

I ස්වාභාවික රක්ෂිත ප්‍රදේශයකි
II ඇතැම් ප්‍රදේශවල හේන් වගාව සිදු කරයි
III අධික සෝදා පාළුවට ලක්වන ප්‍රදේශයකි
IV පස සංරක්ෂණ කටයුතු කල යුතුය
V දිය උල්පත් සහිත ප්‍රදේශයකි
VI සම්පූර්ණයෙන්ම කඳු සහිත ප්‍රදේශයකි

3

I මෙම ප්‍රදේශයේ පවුල් 10 ක් පමණ පදිංචි වී ඇත
II ගෙවතු වල ස්ථාවර භෝග දැකිය හැක. එනසාල් වගාව දැකිය හැකි වේ.
III බෙලි හුල්ඔය අතු ශාඛාව ආරම්භක කොටස
IV ගල් පර්වත සහ හේන් ගොවිතැන දක්නට ලැබේ
V බෑවුම් සහිත ප්‍රදේශයකි. සෝදා පාළුවට ලක්වී ඇත.
VI දිය උල්පත් සහිත ප්‍රදේශයකි. යෝජිත පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි ප්‍රදේශය

2

I පොදු පිට්ටනිය - දැනට අධික සෝදා පාළුවට ලක්වුනු පොදු පිට්ටනිය පිහිටා ඇති අතර එම පිට්ටනිය සංවර්ධනය කල යුතුව ඇත
II මාළිගාතැන්න පාළම දැනට කැඩී ගොස් ඇත. එය ප්‍රතිසංවර්ධනය කල යුතුව ඇත.
III මෙම ප්‍රදේශයේ පවුල් 36 ක් පමණ පදිංචි වී සිටී
IV වැඩි ප්‍රමාණයක් වගා බිම් දැකිය හැකිය. එළවළු හා වී ගොවිතැන කරනු ලබයි
V දරාඹ ඇළ පිහිටා ඇති අතර ඇතැම් ස්ථාන කැඩී ඇත. එම ස්ථාන සංවර්ධනය කල යුතුය.
VI ගෙවතු වගා දැකිය හැකිය. ඇතැම් ස්ථානවල ස්ථාවර භෝග දැකිය හැකිය.
VII මුඩු බිම් පිහිටා ඇති අතර අධික සෝදා පාළුවට ලක්වන ප්‍රදේශයකි. මෙම ප්‍රදේශයේ සංරක්ෂණය කල යුතුය.

1

I වගා බිම් :- මෙම ප්‍රදේශය තුල හේන් සහ කුඹුරු ගොවිතැන් දක්නට ලැබේ. එළවළු හා වී වගාව කරනු ලබයි.
II වාරි මාර්ග :- කුඹුරු සඳහා ප්‍රමාණවත් ජලය ඇති අතර හේන් ගොවිතැන සඳහා වැසි දිය භාවිතයට ගනී. වාරි ඇළ කැඩී ගොස් ඇති අතර
පිළිසකර කල යුතු කොටස් කිපයක් දැකිය හැකිය.
III පානීය ජල ණිගය මෙම ප්‍රදේශයේ පවුල් 25 කට පමණ පානීය ජල ණිගයක් පවතී
IV මෙම ප්‍රදේහයේ තැනින් තැන ස්ථාවර භෝග දැකිය හැකි වේ
V උතුරු දිශාවට විහිදුනු බෙලිහුල් ඔය අතු ශාඛාව දැකිය හැකිය. එම අතු ශාඛාව දෙපස රක්ෂිතය එළිපෙහෙළි කර ඇත.
VI සනීපාරක්ෂක වැසිකිලි පවුල් 10 කට පමණ නොමැත.

ඔය

## හරස්කඩ අධ්‍යයනය 04

4

I ඉහළ කොටසින් (ස්වාභාවික රක්ෂිත) වන වගාව පිහිටා ඇත
II ස්වයං රැකියා ව්‍යාපෘති (කුකුලන් , එළුවන්, කිරිගව) දැකිය හැකිය
III තේ වගා බිම් දැකිය හැකිය
IV පවුල් 45 ක් පමණ පදිංචි වී සිටී
V තේ වතු දැකිය හැකිය
VI ලයින් කාමර දැකිය හැකිය
VII සෞඛ්‍ය / විදුලි / පානීය ජල ගැටළු ඇත

3

I ජල උල්පත් දැකිය හැකිය
II ජල උල්පත් සංරක්ෂක කටයුතු නොමැත
III ගල් පඩි සහිත ගමන් මාර්ගයකි
IV දැඩි බෑවුම් සහිත ප්‍රදේශයකි
V සෞඛ්‍ය ගැටළු පවතී. එනසාල් වගාව දැකිය හැකිය

2

I යල් පැනගිය ජල ටැංකියක් අහැත් , පානීය ජල ගැටළුව බෙහෙවින්ම පවතී
II සෞඛ්‍ය ගැටළු සහිත ප්‍රදේශයකි
III පවුල් 15 ක් පමණ පදිංචි වී සිටී
IV මාර්ගය අධික ලෙස හෝදා පාළුවට ලක්වී ඇත
V අතුරු මාර්ගයක්ද දැකිය හැකිය
VI එළවළු වගාව දැකිය හැකි අතර ප්‍රවාහන අපහසුතා දැකිය හැකිය
VII දැඩි බෑවුම් සහිත ප්‍රදේශයක් බැවින් ප සංරක්ෂණ කටයුතු සිදුකල යුතුය
VIII දෝතුරු කඳුර පිහිටා ඇත

1

I ගම් සහා පාර කි. මී. 1/2 ක් පමණ පඩි දමා සකස් කර ඇත
II මෙම ප්‍රදේශය අධික බෑවුම් සහිතය. පස සංරක්ෂණ ක්‍රම යොදා නැත
III මිශ්‍ර පලතුරු බෝග වගාකර ඇත
IV පවුල් 20 ක් පමණ පදිංචි වී සිටී
V කෘෂිකර්මාන්තය ප්‍රධාන රැකියාව වශයෙන් පිළිගනී
VI පානීය ජල ගැටළුව හා විදුලි බල ගැටළුව ,මාර්ග අපහසුතා දැකිය හැකිය
VII මුඩුබිම් ප්‍රදේශයක්ද දැකිය හැකිය

# දේශගුණික රටාව

## හරස්කඩ අධ්‍යයනය 03

